// **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය**

**අති විශේෂ**

**අංක 2011/33 - 2017 මාර්තු මස 24 වැනි සිකුරාදා - 2017.03.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනත යටතේ බලයලත් නිලධාරීන් පත් කිරීම

**නිවේදනය**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතෙහි උපවගන්ති 14.4 යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න වන මා විසින් උපලේඛනයෙහි පවරා ඇති ප්‍රදේශ සහ සේවා අවශ්‍යතාවය මත වැඩ බැලීමට පත්කරනු ලබන වෙනත් ඕනෑම ප්‍රදේශයක් සම්බන්ධයෙන් එකී පනතේ අරමුණ සඳහා මෙහි උපලේඛනයෙහි දක්වෙන පහත සඳහන් නිලධාරීන් බලයලත් නිලධාරීන් ලෙස පත් කරමි. ඔවුන් නිලබලයෙන් පත් කරනු ලබන අතර මෙහි උපලේඛනයෙහි සඳහන් එකී තනතුරු දරන දැනට සිටින නිලධාරීන් මෙන්ම එකී තනතුරු තත්කාලයෙහි පත් කරනු ලබන නිලධාරීන් ද මෙයින් ආවරණය වේ.

වෛද්‍ය රාජිත සේනාරත්න,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය.

2017 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - (හදිසි වැටලීම්) | දීප ව්‍යාප්ත |
| සහකාර ලේකම් (හදිසි වැටලීම්) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | |
| විමර්ශන නිලධාරීන්/විමර්ශන සහකාරවරුන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට අදාළ ප්‍රදේශය | |

04 - 211

1A - PG 3466 — 507 (2017/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*